# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/17 - 2022 ඔක්තෝබර් මස 10 වැනි සඳුදා - 2022.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 24/51(VII)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 44, 123, 124, 125, 126, 126ආ, 128, 132 132අ සහ 231 වන වගන්ති සමග කියවිය යුතු 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2022 අංක 03 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර අයභාර) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝගවල I වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අරමුණු සඳහා සාමාන්‍ය සේවය සහ එක්දින සේවය සම්බන්ධයෙන් ගෙවිය යුතු අයභාරය පිළිවෙලින්, එම උපලේඛනයේ II වන තීරයේ සහ III වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

3. මෙම නියෝගවල II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති මාර්ගගත සේවය සඳහා ගෙවිය යුතු අයභාරය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

4. 2009 මාර්තු මස 26 වැනි දින අංක 1594/27 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද 2009 අංක 01 දරන රියදුරු බලපත්‍ර (අයභාර) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.


1A - G 6001 — 506 (2022/10)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**I වන උපලේඛනය** *[2 වන නියෝගය]*

*සාමාන්‍ය සේවය සහ එක්දින සේවය සඳහා අයහාර*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *නිකුත් කිරීමේ අරමුණ* | *සාමාන්‍ය සේවා අයහාරය (රු.)* | *එක්දින සේවා අයහාරය (රු.)* |
| 1. පුහුණුවන්නන්ගේ අවසර පත්‍රයක් සහ අලුත් රියදුරු බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම - | | |
| (*අ*) එක් පන්තියක් සඳහා; | 2,500.00 | 3,500.00 |
| (*ආ*) එකවර පන්ති දෙකක් සඳහා; | 3,000.00 | 4,000.00 |
| (*ඇ*) එකවර පන්ති තුනක් හෝ කිහිපයක් සඳහා; | 3,500.00 | 4,500.00 |
| 2. රියදුරු බලපත්‍ර ලිඛිත පරීක්ෂණය සඳහා නැවත ඉල්ලුම් කිරීම සඳහා | 500.00 | - |
| 3. "එල් තහඩු" යුගලයක් සඳහා ඉල්ලුම් කිරීම - | | |
| (*අ*) 11"x 9" ප්‍රමාණය | 1,000.00 | 1,000.00 |
| (*ආ*) 5"x 4" ප්‍රමාණය | 500.00 | 500.00 |
| 4. රියදුරු බලපත්‍ර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නැවත ඉල්ලුම් කිරීම සඳහා | 1,000.00 | - |
| 5. පවත්නා රියදුරු බලපත්‍රයට අලුත් වාහන පන්ති එකතු කිරීම - | | |
| (*අ*) එක් පන්තියක් සඳහා; | 2,500.00 | 3,500.00 |
| (*ආ*) එකවර පන්ති දෙකක් සඳහා; | 3,000.00 | 4,000.00 |
| (*ඇ*) එකවර පන්ති තුනක් හෝ කිහිපයක් සඳහා; | 3,500.00 | 4,500.00 |
| | | |
| 6. රියදුරු බලපත්‍රයක් අලුත් කිරීම හෝ එහි වලංගු කාලය දීර්ඝ කිරීම | | |
| (*අ*) එක් කාලපරිච්ඡේදයක් සඳහා; | 2,800.00 | 4,000.00 |
| (*ආ*) වසරක් හෝ වසරකට අඩු කාලයක් කල් පසුවීම වෙනුවෙන් ගෙවිය යුතු අමතර අයහාරය | 500.00 | - |
| | | |
| 7. (*අ*) පවත්නා වලංගු කාලය සඳහා රියදුරු බලපත්‍රයක අනුපිට-පතක් නිකුත් කිරීම සඳහා; | 2,800.00 | 4,000.00 |
| (*ආ*) රියදුරු බලපත්‍රය අස්ථානගත වීම හේතුවෙන් පවත්නා වලංගු කාලය සඳහා රියදුරු බලපත්‍රයේ අනුපිටපතක් නිකුත් කිරීම සඳහා ඃ | 7,800.00 | 9,000.00 |
| (*ඇ*) වසරක් හෝ වසරකට අඩු කාලයක් කල් පසුවීම වෙනුවෙන් ගෙවිය යුතු අයහාරය | 500.00 | - |
| 8. රියදුරු බලපත්‍රයක උද්ධෘතයක් නිකුත් කිරීම සඳහා | 1,000.00 | - |
| | | |
| 9. රියදුරු බලපත්‍රයක විස්තර වෙනස් කිරීම සඳහා | 3,300.00 | 4,500.00 |
| | | |
| 10. මෙම තීරයේ ඉහත 5, 6 සහ 7 වන අයිතමවල සඳහන් කර ඇති පරිදි - (*අ*) පවත්නා රියදුරු බලපත්‍රයට අලුත් වාහන පන්ති එකතු කිරීම; (*ආ*) රියදුරු බලපත්‍රය අලුත් කිරීම හෝ එහි වලංගු කාලය දීර්ඝ කිරීම; හෝ (*ඇ*) රියදුරු බලපත්‍රයේ අනුපිටපතක් නිකුත් කිරීම, | 500.00 | 500.00 |

I උපලේඛනය (*සම්බන්ධිතයි*)

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *නිකුත් කිරීමේ අරමුණ* | *සාමාන්‍ය සේවා අයභාරය (රු.)* | *එක්දින සේවා අයභාරය (රු.)* |
| සම්බන්ධයෙන් අලුත් රියදුරු බලපත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවේ දී *II වන තීරයේ සහ III වන තීරයේ* අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති අයභාරයට අමතරව, රියදුරු බලපත්‍රයේ විස්තර වෙනස් කිරීම සඳහා. | | |
| | | |
| 11. පවත්නා රියදුරු බලපත්‍රය අලුත් රියදුරු බලපත්‍රයක් බවට පරිවර්ථනය කිරීම සඳහා | 2,800.00 | 4,000.00 |
| 12. (*අ*) ශ්‍රී ලාංකික පුරවැසියකුට අදාළව, විදේශීය රියදුරු බලපත්‍රයක් අලුත් බලපත්‍රයක් බවට පරිවර්ථනය කිරීම සඳහා; | 3,300.00 | 4,500.00 |
| (*ආ*) විදේශීය පුරවැසියකුට අදාළව, විදේශීය රියදුරු බලපත්‍රයක් අලුත් රියදුරු බලපත්‍රයක් බවට පරිවර්තනය කිරීම සඳහා ඃ | 15,000.00 | 20,000.00 |
| | | |
| 13. විදේශීය පුරවැසියකුට රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා | 25,000.00 | 30,000.00 |
| | | |
| 14. මාසයක කාලසීමාවක් සඳහා ආගන්තුකයකුගේ තාවකාලික බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඃ | 2,000.00 | - |
| | | |
| 15. ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා ඃ | 3,000.00 | 3,500.00 |
| | | |
| 16. (ඇසුරුම් ගාස්තු, භාරදීමේ ගාස්තු සහ කුරියර් ගාස්තු ඇතුළුව) තැපැල් ගාස්තු | 225.00 | - |

**II වන උපලේඛනය**

[*3 වන නියෝගය*]

*විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රලාභීන් සඳහා වන මාර්ගගත සේවා සඳහා අයභාර*

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *මාර්ගගත සේවය* | *අයභාරය (ඇ. ඩො.)* |
| විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකික පුරවැසියකු විසින් අදාළ ශ්‍රී ලංකික තානාපති කාර්යාලය හෝ මහ කොමසාරිස් කාර්යාලය හරහා විද්‍යුත් ලිපියක් මගින් කරනු ලබන ඉල්ලීමක් මත, මෝටර් වාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක තොරතුරු මාර්ගගත ක්‍රමයට සත්‍යාපනය කිරීම සඳහා | 25 |

EOG 10 - 0084

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.